# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 14,599 — 1965 දෙසැම්බර් 29 වැනි බදාදා — 1965.12.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරනු ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්.ඩී.—බී. 13/54.

අ. ආ. කා. අංකය : ඩබ්ලිව්. 44.

### යුද්ධ හමුදා පනත

#### 23අ (1) වන වගන්තිය යටතේ වූ ආඥාවයි

1962 අංක 6 දරණ පනතින් සංශෝධිත (357 වන අධිකාරය වන) යුද්ධ හමුදා පනතේ 23අ වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව වන මම, ඒ උප වගන්තිය යටතේ ම විසින් පනවනු ලැබ, 1962 අගෝස්තු මස 11 වන දින අංක 13,260 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද්ද වූ ද, 1965 ජනවාරි මස 13 වන දින අංක 14,291 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ආඥාවෙන් අන්තිම වරට සංශෝධනය කරනු ලැබුවා වූ ද ආඥාව, ඊට යා කොට ඇති උපලේඛනය වෙනුවට මීට යා කොට ඇති උපලේඛනය ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරමි.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාරවරයා.

1965 දෙසැම්බර් 25 වැනි දින,
මහනුවර දී ය.

#### උපලේඛනය

(අ) ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශය,

(ආ) කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය,

(ඇ) ප්‍රසිද්ධ වැඩ, තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය, හෝ

(ඇ) ජනසතු සේවා අමාත්‍යාංශය

යටතේ පවත්නා යම් දෙපාර්තමේන්තුවක් හෝ නීතිගත සංස්ථාවක් හා සම්බන්ධ යම් යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් කිරීමට අවශ්‍ය හෝ නියමිත කිනම් විස්තරයක වුව ද සියලු සේවා, කර්තව්‍ය හෝ වැඩ.

12–1663/1

---

ඇල්. ඩී.—බී. 13/54.

අ. ආ. කා. අංකය : ඩබ්ලිව්. 45.

### ගුවන් හමුදා පනත

#### 23අ (1) වන වගන්තිය යටතේ වූ ආඥාවයි

1962 අංක 7 දරණ පනතින් සංශෝධිත (359 වැනි අධිකාරය වන) ගුවන් හමුදා පනතේ 23අ වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව වන මම, ඒ උප වගන්තිය යටතේ ම විසින් පනවනු ලැබ, 1962 අගෝස්තු 18 වන දින අංක 13,266 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද්ද වූ ද, 1965 ජනවාරි 13 දින අංක 14,291 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ආඥාවෙන් අන්තිම වරට සංශෝධනය කරනු ලැබුවා වූ ද ආඥාව, ඊට යා කොට ඇති උපලේඛනය වෙනුවට මීට යා කොට ඇති උපලේඛනය ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරමි.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාරවරයා.

1965 දෙසැම්බර් 25 වැනි දින,
මහනුවර දී ය.

#### උපලේඛනය

(අ) ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශය,

(ආ) කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය,

(ඇ) ප්‍රසිද්ධ වැඩ, තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය, හෝ

(ඇ) ජනසතු සේවා අමාත්‍යාංශය

යටතේ පවත්නා යම් දෙපාර්තමේන්තුවක් හෝ නීතිගත සංස්ථාවක් හා සම්බන්ධ යම් යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් කිරීමට අවශ්‍ය හෝ නියමිත කිනම් විස්තරයක වුව ද සියලු සේවා, කර්තව්‍ය හෝ වැඩ.

12–1663/2

1831——ආර් 11267—6,950 (65/12)

ඇල්.ඩී.—බී. 13/54.

අ. ආ. කා. අංකය : ඩබ්ලිව්. 49.

## නාවික හමුද පනත

### 21 (1) වන වගන්තිය යටතේ වූ ආඥාවයි

1962 අංක 8 දරණ පනතින් සංශෝධිත (358 වැනි අධිකාරය වන) නාවික හමුද පනතේ 21 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව වන මම, ඒ උප වගන්තිය යටතේ ම විසින් පනවනු ලැබ, 1962 අගෝස්තු මස 18 දින අංක 13,266 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්ද වූ ද, 1965 ජනවාරි මස 13 වෙනි දින අංක 14,291 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ආඥාවෙන් අන්තිම වරට සංශෝධනය කරනු ලැබූවා වූ ද ආඥාව, ඊට යා කොට ඇති උපලේඛනය වෙනුවට මීට යා කොට ඇති උපලේඛනය ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරමි.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාරවරයා.

1965 දෙසැම්බර් 25 වැනි දින,
මහනුවර දී ය.

### උපලේඛනය

(අ) ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශය,

(ආ) කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය,

(ඇ) ප්‍රසිද්ධ වැඩ, තැපැල් හා විදුලි සංදෙශ අමාත්‍යාංශය, හෝ

(ඈ) ජනසතු සේවා අමාත්‍යාංශය

යටතේ පවත්නා යම් දෙපාර්තමේන්තුවක් හෝ නීතිගත සංස්ථාවක් හා සම්බන්ධ යම් යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් කිරීමට අවශ්‍ය හෝ නියමිත කිනම් විස්තරයක වුව ද සියලු සේවා, කර්තව්‍ය හෝ වැඩ.

12–1663/3

---

එල්.ඩී.—බී. 36/57.

## 1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත

### 33 වැනි වගන්තිය යටතේ ආඥාව

1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනතේ 33 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ඇමති, දොන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, 1959 අගෝස්තු 26 වැනි දින අංක 11,840 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද ආඥාවෙන් සංශෝධිත පරිදි, ඉහත කී පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ, 1958 ජූලි මස 23 වැනි දින අංක 11,434 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද නීති ගත කිරීමේ ආඥාවෙන් පිහිටු වනු ලැබූ නීති ගත සංස්ථාවක් වන ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ කාර්‍ය්‍ය සඳහා මීට යා කොට ඇති උප ලේඛනයෙහි නිශ්චිතව සඳහන් ඉඩම අත්කර ගැනීමේ යෝජනාව මේ ආඥාවෙන් අනුමත කරමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ඇමති.

1965 ක්වූ දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ බස්නාහිර පස්දුන් කෝරලේ තෙබුවන නම් ගමෙහි පිහිටි අරප්පලකන්ද වත්ත නම් ඉඩමේ කොටසක් වූ, සීමාසහිත ආදම්ජී ලුක්මන්ජී වතු හිමිකම් කියන, අක්කර 50 ක් පමණ විශාලත්වය ඇති බිම් කොටස සහ එම බිම් කොටසට නැබොඩ–කළුතර මහපාරේ සිට ආදාසූරිය ඔවිට නැමැති ඉඩමෙන් යන පාර. එයට මායිම් :—

උතුරට.— පී. ඩී. මෙලින් ජිනසේන සහ තවත් අය හිමිකම් කියන තිත්තවල ඔවිට යන ඉඩම.
ඇම්. ඩී. අර්නස්ට් සහ තවත් අය හිමිකම් කියන ආදාසූරිය ඔවිට යන ඉඩම.
කේ. ඩී. ලියෝරිස් සහ තවත් අය හිමිකම් කියන දුවේ වත්ත යන ඉඩම.
ඩබ්ලිව්. ඊ. එච්. ප්‍රනාන්දු අයිතිවාසිකම් කියන හිඟුරු ඔවිට සහ මහවල්ලනගොඩ ඔවිට (කොන්දෙස්කර කොටුව) යන ඉඩම.
කේ. ඩී. ආරොන් අප්පුහාමි සහ තවත් අය හිමිකම් කියන ඊරියත්ගල ඔවිට යන ඉඩම.

බස්නාහිරට.— අරප්පල කන්ද වත්තට අයිති කෙත්හේන කඳුබැවුමේ රබර් ඉඩම.
ක්ලයිඩ් වතුයායට අයිති කැටපොලු හේන යන රබර් ඉඩම.
අරප්පල කන්දවත්තට අයිති රබර් ඉඩමේ කොටසක්.

දකුණට.— කේ. ඩී. චාර්ලිස් සහ තවත් අය හිමිකම් කියන වැලි කැපීය කුඹුර නමැති ඉඩම.
ඩී. ඊ. අබේවර්ධන සහ තවත් අය හිමිකම් කියන මාබොඩ කුඹුර නමැති ඉඩම.
කුඩුගල වත්තට අයිති රබර් ඉඩම.

නැගෙනහිරට.— එච්. ඩබ්ලිව්. සිරිසේන සහ තවත් අය හිමිකම් කියන ගොඩෝවිට යන ඉඩම.
කේ. ඩී. මැයිනෝනා හිමිකම් කියන මගුරුදෙනිය යන ඉඩම.
පී. ඩී. රොසලින් නෝනා සහ තවත් අය හිමිකම් කියන පන්දන්ගොඩ වත්ත යන ඉඩම.
ඩබ්ලිව්. ඇම්. ඩී. අමරසිරි සහ තවත් අය හිමිකම් කියන ඇලේගොඩ වත්ත යන ඉඩම.
ඩබ්ලිව්. ඇම්. ඩී. අමරසිරි සහ තවත් අය හිමිකම් කියන ඇලේගොඩඇලන්ද යන ඉඩම.
කේ. සී. කෙලේනිස් සහ තවත් අය හිමිකම් කියන ඇලේගොඩ වත්ත පිටකට්ටිය යන ඉඩම.

12–1655

එල්. ඩී.—බී. 10/59.

## 1959 අංක 16 දරණ තේ (බදු හා අපනයන පාලන) පනත

1959 අංක 16 දරණ තේ (බදු හා අපනයන පාලන) පනතෙහි 4 (1) (ආ) වගන්තිය යටතේ වාණිජ හා වෙළඳ ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

එම්. වී. පී. පීරිස්,
වාණිජ හා වෙළඳ ඇමති.

1965 දෙසැම්බර් 28 වන දින,
කොළඹ දී ය.

### ආ ඥාව

මීට යා කොට ඇති උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිත ව සඳහන් එක් එක් වර්ගයේ තේ සම්බන්ධයෙන් 1959 අංක 16 දරණ තේ (බදු හා අපනයන පාලන) පනතේ 4 (1) වන වගන්තියේ (අ) ඡෙදයෙහි සඳහන් කොට ඇති කලින් ගෙවීම, 1966 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඒ උපලේඛනයේ 2 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිත ව සඳහන් ප්‍රමාණය අනුව තීරණය කළ යුතුය.

1959 අංක 16 දරණ තේ (බදු හා අපනයන පාලන) පනතෙහි 4 (1) (ආ) වගන්තිය යටතේ පනවනු ලැබ 1959 ජූනි 1 වන දින අංක 11,756 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥාව මෙයින් අවලංගු කරනු ලැබේ.

### උපලේඛනය

| 1 වන තීරය | 2 වන තීරය<br>එක් එක් රාත්තලකට<br>ශත |
|---|---|
| උඩරට (හයිග්‍රෝන්) තේ ... ... ... ... | හතළිහයි |
| මැදරට (මීඩියම් ග්‍රෝන්) තේ ... ... ... ... | දහයයි |
| පහතරට (ලෝග්‍රෝන්) තේ ... ... ... ... | දහයයි |

12–1662

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි